සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

COVID - 19 වසංගත තත්ත්වය නිසා මුළු රටටම ඇඳිරිනීතිය පනවා රට වසා දැමීමට සහ සංචරණය සීමා කිරීමට ගත් තීරණයක් සමග ජනතාවට ගමනාගමනය නවතා නිවෙස්වලට වී කාලය ගත කරන්නට සිදුවිය. මෙම තත්ත්වය නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සෞභාග්‍ය ගෙවතු වගා ව්‍යාපෘතිය හඳුන්වා දුන් අතර, ඒ සඳහා www.soubagya.lk වෙබ් අඩවිය ඔස්සේ බීජ ඇනවුම් කිරීමට අවස්ථාව සලසා දුනි.

01. ඉහත සිද්ධියේ සඳහන් අවශ්‍යතාවන් 03 ක් වන්නේ,
(1) සෞඛ්‍ය, සන්නිවේදනය, ඇඳුම් (2) ආහාර, ඇඳුම්, අධ්‍යාපනය
(3) ප්‍රවාහනය, සෞඛ්‍ය, සන්නිවේදනය (4) ආරක්ෂාව, නිවාස, සන්නිවේදනය

02. කෘෂිකාර්මික බීජ අයත් නිෂ්පාදන සාධකය වන්නේ,
(1) භූමිය (2) ශ්‍රමය (3) ව්‍යවසාය (4) ප්‍රාග්ධනය

03. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධ ව්‍යාපාර සංවිධාන වර්ගය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
(1) නීතිමය කටයුතුවලදී දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල නාමයෙන් පෙනී සිටිය යුතු නොවේ.
(2) ජනතාවට අත්‍යවශ්‍ය සේවා සැපයීම බොහෝවිට දෙපාර්තමේන්තුවලින් සිදුවේ.
(3) රජයේ වාර්ෂික අයවැය ලේඛනයෙන් මුදල්වෙන් කෙරේ.
(4) පාර්ලිමේන්තුවේ හා අදාළ අමාත්‍යාංශ පාලනය යටත් වේ.

04. ව්‍යාපාර වසා දැමීම නිසා බලපෑම් ඇති කරන පරිසරය වන්නේ,
(1) දේශපාලන පරිසරය (2) තාක්ෂණික පරිසරය
(3) ආර්ථික පරිසරය (4) ගෝලීය පරිසරය

05. www.saubagya.lk අයත් සන්නිවේදන මාධ්‍යට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) අභ්‍යන්තර විද්‍යුත් නොවන සන්නිවේදන මාධ්‍යයකි.
(2) වාචික විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයකි.
(3) විද්‍යුත් ලිඛිත අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයකි.
(4) බාහිර විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයකි.

06. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක ලක්ෂණයක් වන්නේ,
(1) ස්පර්ශ කළ නොහැකි දෑ නිෂ්පාදනය කරයි. (2) භෞතික පැවැත්මක් ඇති දෑ නිෂ්පාදනය කරයි.
(3) වුවමනා සපුරාලන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියකි. (4) ගබඩා කර තබා ගත නොහැකිය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

07. කමල් චීනයේන බෑග් මැසීමට අවශ්‍ය රෙදි ගෙනවිත් විවිධ ප්‍රදේශවල බෑග් සැකසුම්කරුවන්ට බෙදාහැර ඒ අනුව කමල්,

(1) නිෂ්පාදකයෙක්. (2) පාරිභෝගිකයෙක්. (3) සැපයුම්කරුවෙක්. (4) තරගකරුවෙක්.

08. A 2007 අංක 7 දරණ සමාගම් පනත

B 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

C 1972 අංක 5 දරණ සමූපාකාර සමිති පනත

D 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත

E පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය

මෙම අකුරුවලින් හවුල් ව්‍යාපාරවලට බලපාන පනත් වනුයේ,

(1) ABC පමණි. (2) ABCD පමණි. (3) ABDE පමණි. (4) BCDE පමණි.

09. සෑම වාණිජ බැංකුවක් ම නිකුත් කරන චෙක්පත්වල චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම්තීරුවක්(MICR) දක්නට ඇත. එම තීරුවේ අංක පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) බැංකු ගිණුම් අංකය, බැංකු ශාඛා අංකය, බැංකුවේ අංකය, චෙක්පත් අංකය.

(2) චෙක්පත් අංකය, බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය, බැංකු ගිණුම් අංකය.

(3) චෙක්පත් අංකය, බැංකු ගිණුම් අංකය, බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය.

(4) බැංකුවේ අංකය, බැංකු ශාඛා අංකය, චෙක්පත් අංකය, බැංකු ගිණුම් අංකය.

10. ගනුදෙනුවකට අදාළ නියමිත වටිනාකම ගැණුම්කරුගේ ගිණුමෙන් අඩු වී බැංකුව හරහා විකුණුම්කරුගේ ගිණුමට මාරුවීම. මෙයට අදාළ කාඩ්පත වන්නේ,

(1) හරපත (2) ණයපත

(3) බැරපත (4) වීසා කාඩ්පත

11. සමරජීව පාදයේ ආබාධයක් ඇති අයෙකි. ඔහු ජීවිත රක්ෂණයක් සඳහා රක්ෂණ යෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ අතර එහි ආබාධ ඇත් ද? යන ප්‍රශ්නයට නැත වශයෙන් පිළිතුරු සපයා තිබුණි. බිඳ වැටී ඇති රක්ෂණ මූලධර්මය වන්නේ,

(1) හානි පූරණය (2) දායකත්වය (3) රක්ෂණ හිමිකම (4) උපරිම විශ්වාසය

12. ප්‍රවාහනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මහාමාර්ග ප්‍රවාහනය ගමනාන්තය දක්වාම යොදාගත නොහැක.

(2) ගුවන් ප්‍රවාහනයේදී බරින් අධික ද්‍රව්‍ය ප්‍රවාහනය කළ හැක.

(3) දුම්රිය ප්‍රවාහනය නියමිත කාල සටහනකට අනුව සිදුවේ.

(4) ප්‍රවාහන වියදම් ඉහළයාම භාණ්ඩ මිල ඉහළ යාමට හේතු නොවේ.

13. තොග වෙළෙඳාමක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) ජයමග ක්‍රීඩා සමාජයේ වාර්ෂික දන්සැල සඳහා පරිප්පු 100 kg ක් විකිණීම.

(2) පාසල් ශිෂ්‍යයෙක් පොත් හලකින් අභ්‍යාස පොත් මිලට ගැනීම.

(3) සහන් පෙරේරා තම නිවසේ සාදයකට සමගි බේකර්ස් වෙතින් පාන් රාත්තල් 10 kg ගැනීම.

(4) මාතර හෝටලයට නිපුන හාල් 200 kg විකිණීම.

14. වයඹ සිසුජය මහා විද්‍යාලයේ 2019 වර්ෂයේ වාර්ෂික සැලසුමට අනුව අපේක්ෂිත සා/පෙළ සමත් ප්‍රතිශතය 90% ක් විය. නමුත් 2019 සා/පෙළ ප්‍රතිඵල ලැබුණේ 70% කි. අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම පිළිබඳව සොයා බලන ලදී. මෙයට අදාළ කළමනාකරණ කාර්ය වන්නේ,

(1) සැලසුම්කරණය (2) පාලනය (3) සංවිධානකරණය (4) මෙහෙයවීම

15. ඥාණපාල නිර්මාණ මහතා COVID - 19 වසංගතයෙන් පීඩා විඳින රෝගීන් සඳහා ප්‍රතිශක්තිය වඩවන පානයක් දේශීය ඖෂධ වර්ග භාවිතයෙන් හඳුන්වා දෙන ලදී. එහිදී ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක් එම ඖෂධීය පානය පිළිබඳ දේශනයක් පවත්වන ලදී.
මෙයින් පිළිඹිබු කරන අලෙවිකරණ විචල්‍ය වන්නේ,

(1) නිෂ්පාදිතය, ප්‍රවර්ධනය (2) ස්ථානය, නිෂ්පාදිතය
(3) නිෂ්පාදිතය, මිල (4) ස්ථානය, ප්‍රවර්ධනය

16. සීමා සහිත ශක්ති සමාගමේ කොටස් 100 ක් එකක් රු. 100 බැගින් මිලදී ගත් දිදුලට එම කොටස් සියල්ල රු. 110 විකුණා රු. 1 000 අමතර මුදලක් ලැබුණි. එය මුදල හඳුන්වන්නේ,

(1) ලාභාංශ ලෙසය. (2) ප්‍රාග්ධන ලාභ ලෙසය.
(3) ලාභ ලෙසය. (4) පොළී ආදායම ලෙසය.

17. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.
රු. 500 000 ක් ප්‍රාග්ධනය ලෙස ගෙන ඒම.
මෙම ගනුදෙනුව මගින් ව්‍යාපාරයේ,

(1) වත්කම් පමණක් වෙනස් වේ. (2) වගකීම් පමණක් වෙනස් වේ.
(3) වත්කම් හා හිමිකම් පමණක් වෙනස් වේ. (4) වත්කම් හා වගකීම් පමණක් වෙනස් වේ.

18. පහත ගනුදෙනු අතුරෙන් හිමිකම වැඩිවන ගනුදෙනුව තෝරන්න.

(1) රු. 25 000 ක බැංකු ණයක් ගැනීම. (2) රු. 25 000 කොමිස් ආදායමක් ලැබීම.
(3) රු. 8 000 ක වැටුප් ගෙවීම. (4) රු. 12 000 ක ලී බඩු මිලදී ගැනීම.

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 19 හා 20 ට පිළිතුරු සපයන්න.**
අනුරගේ ව්‍යාපාරය විසින් රු. 30 000 ක පිරිවැය වූ භාණ්ඩ තොගයක් සෙනුරගේ ව්‍යාපාරයට රු. 40 000 ට ණයට විකුණන ලදී. ණය ආපසු ගෙවීමේදී ණය මුදලින් 10% ක වට්ටමක් ලබා දී ඇත.

19. ඉහත ගනුදෙනුව නිසා අනුරගේ ව්‍යාපාරයට ලද ලාභය කොපමණද?

(1) රු. 40 000 කි. (2) රු. 10 000 කි. (3) රු. 6 000 කි. (4) රු. 4 000 කි.

20. සෙනුරගේ ව්‍යාපාරයේ මුදල් ගෙවීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

(1)

| | | | |
|---|---|---|---|
| ණයහිමි ගිණුම | හර | 40 000 | |
| මුදල් ගිණුම | බැර | | 40 000 |

(2)

| | | | |
|---|---|---|---|
| ණයහිමි ගිණුම | හර | 36 000 | |
| මුදල් ගිණුම | බැර | | 36 000 |

(3)

| | | | |
|---|---|---|---|
| ණයහිමි ගිණුම | හර | 40 000 | |
| මුදල් ගිණුම | බැර | | 36 000 |
| ලද වට්ටම් ගිණුම | බැර | | 4 000 |

(4)

| | | | |
|---|---|---|---|
| ණයහිමි ගිණුම | හර | 40 000 | |
| මුදල් ගිණුම | බැර | | 36 000 |
| දුන් වට්ටම් ගිණුම | බැර | | 4 000 |

21. ව්‍යාපාරයක ලෙජරයේ පවතින ........①........ වත්කම් ගිණුමක් වන අතර, ගැනිලි ගිණුම ..........②........ ගිණුමක් වේ.
ඉහත ප්‍රකාශණයේ ① හා ② යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) බැංකු ණය ගිණුම, හිමිකම් (2) ලී බඩු ගිණුම, වියදම්
(3) බැංකු ණය ගිණුම, හිමිකම් (4) ලී බඩු ගිණුම, හිමිකම්

- **22 හා 23 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු අදාළ කරගන්න.**

| ගනුදෙනුව | | | මූලාශ්‍ර ලේඛන | |
|---|---|---|---|---|
| 1. | කොමිස් ආදායම් ලැබීම | රු. 2 000 | A | ජ'නල් වවුචරය |
| 2. | අමරට ණයට විකුණුම් | රු. 30 000 | B | ගෙවීම් වවුචරය |
| 3. | විදුලි වියදම් ගෙවීම් | රු. 4 000 | C | ලදුපත |
| 4. | අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි | රු. 1 500 | D | විකුණුම් ඉන්වොයිසිය |

22. ඉහත දී ඇති ගනුදෙනු අනුපිළිවෙල අනුව මූලාශ්‍ර ලේඛන නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
(1) ADCB (2) CDAB (3) CDBA (4) CABD

23. ඉහත ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලික සටහන් පොත් පිළිවෙලින් දක්වා ඇත්තේ,
(1) මුදල් පොත, විකුණුම් ජ'නලය, මුදල් පොත, පොදු ජ'නලය
(2) මුදල් පොත, ගැනුම් ජ'නලය, සුළු මුදල් පොත, මුදල් පොත
(3) මුදල් පොත, විකුණුම් ජ'නලය, මුදල් පොත, ගැනුම් ජ'නලය
(4) මුදල් පොත, පොදු ජ'නලය, මුදල් පොත, පොදු ජ'නලය

24. බැංකු ප්‍රකාශණයේ දැක්වෙන ශේෂය හා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ පවතින ශේෂය අතර වෙනසට බල නොපාන හේතුව වන්නේ,
(1) රු. 2 000 ක බැංකු ගාස්තුවක් අයකර තිබීම.
(2) රු. 8 000 ක ණයගැතියෙකු සෘජුවම බැංකුවට මුදල් එවීම.
(3) රු. 5 000 ක ණයහිමියෙකුට නිකුත් කළ චෙක්පතට බැංකුව ගෙවීම් කිරීම.
(4) රු. 6 000 ක තැන්පත් කළ චෙක්පත බැංකුව ගිණුමට බැර නොකිරීම.

- **25 සහ 26 ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

සුරංගගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 8 000 කි. 2020 ජනවාරි මාසයේ සුළු මුදල් විශ්ලේෂණ තීරුවල ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| ගමන් වියදම් | රු. 1 800 |
| තැපැල් වියදම් | රු. 2 000 |
| ලිපිද්‍රව්‍ය | රු. 1 200 |
| විවිධ වියදම් | රු. 2 300 |

25. සුරංගගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම කොපමණද?
(1) රු. 2 000 කි. (2) රු. 2 300 කි. (3) රු. 7 300 කි. (4) රු. 8 000 කි.

26. 2020.02.01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණද?
(1) රු. 2 000 කි. (2) රු. 7 300 කි. (3) රු. 9 300 කි. (4) රු. 10 000 කි.

27. මුදල් පොත යනු,
(1) ලෙජර් ගිණුමකි.
(2) මූලික සටහන් පොතකි.
(3) මූලික සටහන් පොතක් මෙන්ම ලෙජර් ගිණුමකි.
(4) මූලික සටහන් පොතක් මෙන්ම මූල්‍ය ප්‍රකාශනයකි.

28. රු. 1 500 ක දුන් වට්ටම, ලද වට්ටම් ගිණුමේ සටහන් වී ඇත. මෙම වරද නිවැරදි කිරීම වාර්තා කළ යුතු මූලික සටහන් පොත කුමක්ද?
(1) ගැනුම් ජ'නලයයි. (2) විකුණුම් ජ'නලයයි. (3) පොදු ලෙජරයයි. (4) පොදු ජ'නලයයි.

- **29 හා 30 ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

රු. 2 500 ක විදුලි වියදම් ගෙවීම ලෙජරයේ සටහන් කර තිබූ ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| විදුලි වියදම් ගිණුම | හර | 5 200 |
| මුදල් ගිණුම | බැර | 2 500 |

29. ඉහත වරද නිසා,

(1) ශේෂ පිරික්සුමේ හර හා බැර තීරු අතර වෙනසක් ඇති නොවේ.

(2) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු. 2 700 ක් වැඩි වේ.

(3) අවිනිශ්චිත ගිණුමේ රු. 2 700 ක හර ශේෂයක් ඇති වේ.

(4) අවිනිශ්චිත ගිණුමේ රු. 2 700 ක බැර ශේෂයක් ඇති වේ.

30. ඉහත වරද නිවැරදි කිරීමේ නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

(1) මුදල් ගිණුම හර 2 700
විදුලි වියදම් ගිණුම බැර 2 700

(2) අවිනිශ්චිත ගිණුම හර 2 700
විදුලි වියදම් ගිණුම බැර 2 700

(3) මුදල් ගිණුම හර 2 700
අවිනිශ්චිත ගිණුම බැර 2 700

(4) විදුලි වියදම් ගිණුම හර 2 700
මුදල් ගිණුම බැර 2 700

31. එකමුතු ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 500 දෙනෙකු 2019/01/01 දිනට සිටි අතර වර්ෂය තුළදී සාමාජිකයන් 40 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොතිබුණි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 100 ක් නම් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන සාමාජික මුදල් ආදායම වනුයේ,

(1) රු. 40 000 කි. (2) රු. 50 000 කි. (3) රු. 46 000 කි. (4) රු. 54 000 කි.

32. 'රස' බේකරි නිෂ්පාදන ආයතනයේ මාසයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| තිරිඟු පිටි සඳහා පිරිවැය | 100 000 |
| මුරකරු වැටුප් | 20 000 |
| කම්හල් කුලී | 15 000 |
| විදුලිය | 12 000 |
| නිෂ්පාදන වැටුප් | 40 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 3 000 |

මෙම ආයතනයේ ප්‍රාථමික පිරිවැය හා පොදු කාර්ය පිරිවැය පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) 135 000 ක් හා 55 000 ක් ලෙසය. (2) 143 000 ක් හා 47 000 ක් ලෙසය.

(3) 120 000 ක් හා 70 000 ක් ලෙසය. (4) 147 000 ක් හා 43 000 ක් ලෙසය.

33. අශේන්ගේ ව්‍යාපාරය 2019 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු. 80 000 ක් ගෙවා ඇති අතර තවත් රු. 20 000 ක් ගෙවීමට ඇත. ඉහත ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය ගිණුම්ගත කිරීමට අදාළ නිවැරදි ජ'නල සටහන වනුයේ,

(1) ගොඩනැගිලි කුලී ගිණුම හර 100 000
ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම බැර 100 000

(2) ගොඩනැගිලි කුලී ගිණුම හර 20 000
ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම බැර 20 000

(3) ලාභාලාභ ගිණුම හර 20 000
ගොඩනැගිලි කුලී ගිණුම බැර 20 000

(4) ගොඩනැගිලි කුලී ගිණුම හර 80 000
ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම බැර 80 000



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

34. හංසිගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| 2019/01/01 තොගය | 15 000 |
| විකුණුම් | 400 000 |
| ගැණුම් | 250 000 |
| ගෙනඒමේ කුලී | 5 000 |
| අවසන් තොගය | 25 000 |

මෙම ව්‍යාපාරයේ 2019/12/31 අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය හා දළ ලාභය වනුයේ,

(1) 245 000 ක් හා 155 000 කි. (2) 245 000 ක් හා 400 000 කි.
(3) 270 000 ක් හා 130 000 කි. (4) 400 000 ක් හා 245 000 කි.

35. අරවින්දගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමෙහි විදුලි වියදම් රු. 4 000, ශේෂ පිරික්ෂුමේ හර පැත්තේ රු. 400 ක් ලෙස සටහන්ව ඇත. මේ හේතුවෙන් අවිනිශ්චිත ගිණුමෙහි දක්නට ඇති ශේෂය,

(1) රු. 3 600 හර ශේෂයකි. (2) රු. 3 600 බැර ශේෂයකි.
(3) රු. 400 හර ශේෂයකි. (4) රු. 400 බැර ශේෂයකි.

ABC ව්‍යාපාරයේ 2019/12/31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුම පහත පරිදි වේ. ඒ ඇසුරින් 36 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| 2019/01/01 තොගය | 40 000 | |
| ගැනුම් | 200 000 | |
| විකුණුම් | | 500 000 |
| විදුලිය | 10 000 | |
| රක්ෂණය | 15 000 | |
| ප්‍රචාරණය | 30 000 | |
| ප්‍රාග්ධනය | | 365 000 |
| ණයහිමියෝ | | 70 000 |
| 10% බැංකු ණය | | 300 000 |
| මුදල් | 50 000 | |
| ණයගැතියෝ | 40 000 | |
| ඉඩම් | 350 000 | |
| මෝටර් රථ | 500 000 | |
| | 1235 000 | 1235 000 |

36. අරවින්දගේ ව්‍යාපාරයේ 2019 වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,

(1) 40 000 කි. (2) 200 000 කි. (3) 240 000 කි. (4) 260 000 කි.

37. 2019/12/31 න් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණද?

(1) 260 000 කි. (2) 160 000 කි. (3) 175 000 කි. (4) 85 000 කි.

38. 2019/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා ගතයුතු ජංගම වත්කම් වල වටිනාකම,

(1) 90 000 කි. (2) 50 000 කි. (3) 40 000 කි. (4) 30 000 කි.

39. මෙම ව්‍යාපාරයේ 2019/12/31 දිනට හිමිකම කොපමණද?

(1) 175 000 කි. (2) 365 000 කි. (3) 540 000 කි. (4) 1235 000 කි.

40. මෝටර් රථ 10% බැගින් ක්ෂය කරන්නේ නම් මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි 2019/12/31 දිනට හඳුනාගනු ලබන ජංගම නොවන වත්කම් වල වටිනාකම වනුයේ,

(1) 350 000 කි. (2) 500 000 කි. (3) 800 000 කි. (4) 850 000 කි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය  60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II  කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයः |
|---|

වැදගත් :
- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයටත් **I** කොටසින් ප්‍රශ්න දෙකකටත් **II** කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

COVID-19 වසංගත තත්ත්වය ලොව පුරා පැතිර යාම හරහා ලොව පුරා සියළු කටයුතු අඩපණ විය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට බලපෑ අතර රජය විවිධ නීතිරීති පනවමින් සෞඛ්‍ය හා ආරක්ෂක අංශ සමඟ තත්ත්වය මනා ලෙස පාලනය කළේය. රජය මුඛ ආවරණ පැළඳීම අනිවාර්ය කිරීමත් සමඟ එම තත්ත්වය වටහා ගත් ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳ මනා අත්දැකීම් ඇති යසනාත් බංඩාර හෙල්දි මාක්ස් නමින් මුඛ ආවරණ මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2020.04.01 දින ව්‍යාපාරය ආරම්භ කළ අතර එදින රු. 500 000 වටිනා ගොඩනැගිල්ල සහ රු. 240 000 වටිනා මහන මැෂින් 02 ක්ද යොදවන ලදී. එදිනට රු. 200 000 බැංකු ණයක් ලබා ගන්නා ලදී. සෞඛ්‍යාරක්ෂිත නියම ප්‍රමිතියෙන් යුතු මුඛ ආවරණ මැසීම ඔහුගේ අරමුණ වූ අතර ඒ සඳහා මනා පළපුරුද්දක් ඇති සේවකයන් 02 ක්ද එක් අත් උදව් කරුවෙක්ද බඳවා ගන්නා ලදී.

2020/04/31 දිනෙන් අවසන් මාසය තුල සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2020/04/02 | රෙදි මිලදී ගැනුම් | රු. | 50 000/- |
| 2020/04/03 | අනෙකුත් ද්‍රව්‍ය | රු. | 6 000/- |
| 2020/04/04 | ඇසුරුම් ද්‍රව්‍ය | රු. | 4 000/- |
| 2020/04/13 | රෙදි ණයට ගැනුම් | රු. | 10 000/- |
| 2020/04/25 | මාසික විදුලි බිල | රු. | 3 000/- |
| 2020/04/26 | මහන මැෂින් ක්‍රියාකරවන්නන්ට | රු. | 60 000/- |
| 2020/04/28 | අත් උදව්කරුට | රු. | 20 000/- |

මෙම මාසය තුළ මිලදී ගත් සියළු ද්‍රව්‍ය භාවිතා කර ඇති අතර මුඛ ආවරණ 1000 නිෂ්පාදනය කළ අතර, ඒවා සියල්ල 4/30 දින අලෙවි කරන ලදී. මුඛ ආවරණ පිරිවැය මත 20% ලාභයක් ලැබෙන පරිදි විකුණුම් මිල තීරණය කරන ලදී. මුඛ ආවරණ තාම විසින් ම නගරයට රැගෙන ගොස් සිල්ලර අලෙවි සැල්වලට අලෙවි කරයි. ඒ සඳහා තමා සතු ත්‍රීරෝද රථය යොදා ගන්නා ලදී. මහන මැෂින් 10% බැගින් වාර්ෂික ක්ෂය කරනු ලැබේ. ඊළඟ මාසයේ ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව ඊළඟ මාසයේ ආරක්ෂිත ඇඳුම් කට්ටල මැසීමට තීරණය කරන ලදී.

(i) (අ) හෙල්දි මාක්ස් ව්‍යාපාර අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? (ල.01)

(ආ) හෙල්දි මාක්ස් ව්‍යාපාරය සපයන අවශ්‍යතාව හා වුවමනාව නම් කරන්න. (ල.01)

(ii) (අ) COVID-19 වසංගතය පැතිර යාම
රාජ්‍ය නව නීතිරීති පැනවීම.
අයත් ව්‍යාපාර බාහිර පරිසර බලවේග පිළිවෙලින් නම් කරන්න. (ල.01)

(ආ) මෙම ව්‍යාපාරය තුළ දැකිය හැකි අවස්ථාවක් සහ ශක්තියක් නම් කරන්න. (ල.01)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) (අ) හෙල්දි මාක්ස් ව්‍යාපාරයේ බෙදා හැරීමට අදාළ ප්‍රවාහන මාධ්‍ය හා මාර්ගය ලියන්න. (ල.01)

(ආ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව 02 නම් කරන්න. (ල.01)

(iv) (අ) කළමනාකරණ ක්‍රියාවලියේ සැලසුම්කරණයට හා සංවිධානකරණයට අයත් කාර්ය බැගින් ලියන්න. (ල.01)

(ආ) A 20% ලාභයක සහිව මුඛ ආවරණ විකිණීම

B මුඛ ආවරණ නගරයට රැගෙන ගොස් අලෙවි කිරීම.

ඉහත සාධක දෙක අයත් අලෙවි විචල්‍යයන් 02 නම් කරන්න. (ල.01)

(v) 2020.04.01 දිනට ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න. (ල.02)

(vi) (අ) 2020.04.13 ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත නම් කරන්න. (ල.01)

(ආ) හෙල්දි මාක්ස් ව්‍යාපාරයේ 2020.04.30 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙල කරන ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතු මුළු ගැනුම් වටිනාකම කොපමණද? (ල.01)

(vii) (අ) 2020 අප්‍රේල් මාසය සඳහා මහන මැෂින්වල ක්ෂය ප්‍රමාණය ගණනය කරන්න. (ල.01)

(ආ) මහන මැෂින් ක්ෂය ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන් ලියා දක්වන්න. (ල.01)

(viii) හෙල්දි මාක්ස් ආයතනයේ 2020.04.28 දිනට මුදල් ශේෂය ගණනය කරන්න. (ල.02)

(ix) (අ) 2020 අප්‍රේල් මාසයේ මුඛ ආවරණයක මුළු නිෂ්පාදන පිරිවැය ගණනයකරන්න. (ල.01)

(ආ) මුඛ ආවරණයක විකුණුම් මිල ගණනය කරන්න. (ල.01)

(x) (අ) 2020.04.30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය ගණනය කරන්න. (නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළිබඳ දැනුම භාවිතයෙන්) (ල.01)

(ආ) 2020.04.30 දිනට හිමිකම ගණනය කරන්න. (ල.01)

(ලකුණු 20)

# I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) මිනිස් අවශ්‍යතාවයන් යනු කුමක්ද?

(ආ) මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) නැවත විකිණීම සඳහා භාණ්ඩ අලෙවි කිරීම තොග වෙළදාමයි. (................)

(ආ) මූල්‍ය ආයතන ව්‍යාපාරවල ඇල්මැති පාර්ශවවලට අයත් නොවේ. (................)

(ඇ) ව්‍යාපාර අවස්ථා පැන නගින්නේ ව්‍යාපාර බාහිර පරිසරයෙනි. (................)

(ඈ) කේවල ස්වාමි ව්‍යාපාරවල වගකීම සීමිත වේ. (................)

(ල.02)

(iii) යාපනේ පදිංචි ශිව කුමාර් තම ප්‍රදේශයේ මිදි වගා කරුවන්ගෙන් මිලදී ගන්නා මිදිවලින් යන්ත්‍රානුසාරයෙන් මිදි යුෂ නිෂ්පාදනය කර බෝතල්වල අසුරා "කුමාර් මිදි පානය" නමින් වෙළඳ සේවකයන් දෙදෙනෙකු යොදාගෙන ප්‍රදේශයේ සිල්ලර වෙළෙඳසැල්වලට අලෙවි කරයි.

(අ) නිෂ්පාදන සාධක 02 ක් නම්කර ඉහත සිද්ධියෙන් ඒ සඳහා උදාහරණ එක බැගින් සොයන්න.

(ආ) ශිව කුමාර්ගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් මෙම සිද්ධිය ඇසුරින් සඳහන් කරන්න.

(ල.02)

(iv) නිකවැරටිය ප්‍රදේශයේ පදිංචි සුමනදාස තම රජයේ රැකියාවට අමතරව කුකුලන් හා කිරි එළදෙනුන්ගේ ගොවිපලක් පවත්වාගෙන යයි. කාබනික වගාවන් කෙරෙහි උනන්දුවක් දක්වන මෙවන් වකවානුවක නිකවැරටිය ප්‍රදේශයේ බහුල කාබනික පොහොර නිපදවීමටද ඔහු තුල අදහසක් ඇත.

(අ) සුමනදාසගේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපාරය, නිෂ්පාදිතයේ ස්වභාවය අනුව අයත් වන්නේ කවර ව්‍යාපාර වර්ගයකටද?

(ආ) සුමනදාසගේ ව්‍යාපාරයට මුහුණ පෑමට සිදුවන තර්ජනයක් සඳහන් කරන්න. (ල.02)



(ලකුණු 08)

03. (i) (අ) ව්‍යාපාර සංවිධාන වර්ගකල හැකි නිර්ණායක 02 ක් සඳහන් කරන්න.

(ආ) සමූපකාර සමිතිවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) චෙක්පතක මුහුණත සමාන්තර රේඛා දෙකක් තුල "ආදායකයාගේ ගිණුමට පමණයි." යනුවෙන් සඳහන් නම් එය විශේෂ රේඛකයකි. (..................)

(ආ) හානිපූර්ණ මූලධර්මය ජීවිත හා දේපල යන රක්ෂණ දෙකටම අදාළ වේ. (..................)

(ඇ) හර කාඩ්පතකින් ගනුදෙනු කිරීම සඳහා බැංකු ගිණුමක් අවශ්‍ය වේ. (..................)

(ඈ) ආයතනයක් වෙනත් ආයතනයක් සමඟ පණිවුඩ, තොරතුරු හා අදහස් හුවමාරුකර ගැනීම අභ්‍යන්තර සන්නිවේදනයට අයත් වේ. (..................)

(ල.02)

(iii) මාතර මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුමක් හිමි සිරිදාස, මහරගම ලංකා බැංකු ශාඛාවේ ජංගම ගිණුමක් හිමි පියදාසට තිබූ රුපියල් ලක්ෂයක ණයක් වෙනුවෙන් චෙක්පත් නිකුත් කරන ලදී.

(අ) මෙහි අණකරු, අණලදු හා ආදායකයා නම් කරන්න.

(ආ) මෙම චෙක්පතට පූර්ණ ආරක්ෂාවක් ලැබෙන පරිදි රේඛණය කරන අයුරු දක්වන්න. (ල.02)

(iv) පානීය ජල බෝතල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කාන්ති එම ජල බෝතල් සැපයුම්කරු වන රූකාන්තට ජල බෝතල් තොගයක් එවන ලෙස ජංගම දුරකතනය මගින් කෙටි පණිවුඩයකින් දැනුම් දෙන ලදී. රූකාන්ත, එදිනම ජල බෝතල තොගය ඔහුගේම ලොරි රථයකින් එවීමට කටයුතු කරන බව කෙටි පණිවුඩයක් මගින් කාන්තිට දැනුම් දෙන ලදී.

(අ) ජල බෝතල් තොගය ප්‍රවාහනයට ලොරි රථයක් යොදා ගැනීමට හේතු 02 ක් සඳහන් කරන්න.

(ආ) මෙම සිද්ධිය ඇසුරින් සන්නිවේදන මූලිකාංග වන පණිවුඩය, මාධ්‍යය, ප්‍රතිචාරය, ප්‍රතිපෝෂණය යන්නට අදාළ කරුණු වෙන වෙනම දක්වන්න. (ල.02)

(ලකුණු 08)

04. (i) (අ) කළමනාකරණ කාර්යයක් වන සැලසුම්කරණය යනු කුමක්ද? (ල.01)

(ආ) ඉලක්ක වෙළෙඳ පොළක් යන්න හඳුන්වන්න. (ල.01)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද, යන්න සඳහන් කරන්න.

(අ) භාණ්ඩයකට හෝ සේවාවකට සාධාරණ මිලක් ලකුණු කිරීම අලෙවිකරණයට අයත් කටයුත්තකි.

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන ස්ථානය යනු විකිණීම සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගන්නා ස්ථානයක් පමණි.

(ඇ) රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා යොදාගන්නා මූල්‍ය උපකරණයකි භාණ්ඩාගාර බිල්පත්

(ඈ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතුරින් ව්‍යාපාරයකට ආදායම් ලබාදෙන එකම විචල්‍යය වනුයේ නිෂ්පාදිතයයි. (ල.02)

(iii) "නිරෝගා" රෝගීන් බල ගැනීම සඳහා සාත්තු සේවිකාවන් සපයන පෞද්ගලික ව්‍යාපාර ආයතනයකි. ඔවුන් විසින් සිදුකරන කටයුතු කීපයක් පහත දැක්වේ.

(අ) සාත්තු සේවිකාවන් දහ දෙනෙකු අළුතින් බඳවා ගැනීම.

(ආ) දැනට සේවය කරන සාත්තු සේවිකාවන්ගේ සේවය සතුටුදායකදැයි සොයා බැලීම.

(ඇ) සාත්තු සේවිකාවන් අළුතින් බඳවා ගැනීමට තීරණය කිරීම.

(ඈ) යහපත් වෘත්තීය සම්බන්ධතා පවත්වා ගැනීම තුලින් තම කාර්යය නිසිලෙස ඉටුකිරීමට අළුතින් බඳවාගත් සේවිකාවන් පෙලඹවීම.

ඉහත කටයුතු එක් එක් කළමනාකරණ කාර්යයන් යටතේ දක්වන්න. (ල.02)

(iv) (අ) ආයෝජනය යන්න හඳුන්වන්න. (ල.01)

(ආ) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ කුමක්ද? (ල.01)

(ලකුණු 08)

# II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) වගකීමක් යනු කුමක්ද?

(ආ) ලෙජරයේ දැකගත හැකි වත්කම් ගිණුම් දෙකක් ලියන්න. (ල.02)

(ii) පහත දක්වා ඇති ද්විත්ව සටහන්වලට අදාළ ගනුදෙනුව ලියන්න.

(අ) මුදල් ගිණුම හර 50 000
බැංකු ණය ගිණුම බැර 50 000

(ආ) ගැනුම් ගිණුම හර 10 000
ණයහිමි ගිණුම බැර 10 000 (ල.02)

(iii) ව්‍යාපාරයක 2020 ජනවාරි මසෙයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(1) රු. 10 000 ක භාණ්ඩ තොගයක් රු. 12 500 කට අත්පිට මුදලට විකිණීම.

(2) රු. 20 000 ක බැංකු ණය වාරිකයක් ගෙවීම, මෙහි ඇතුලත් වූ පොළිය රු. 4 000 කි.

(3) රු. 30 000 ක ණයහිමියන්ට රු. 2 000 ක වට්ටමකට යටත්ව මුදල් ගෙවීම.

(4) රු. 4 000 ක විදුලි වියදම් ගෙවීම.

(5) රු. 50 000 ක ලී බඩු අත්පිට මිලට ගැනීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු පහත සඳහන් ආකෘතියට ඇතුලත් කිරීම. (පළමු ගනුදෙනුව උදාහරණ ලෙස දකවා ඇත.)

(ආ) ආරම්භක දිනට රු. 175 000 ක මුදලක් පැවතියේ නම් ගනුදෙනුවලින් පසු මුදල් ශේෂය ගණනය කිරීම.

| | ගනුදෙනුව | වත්කම = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|---|
| උදා:- | 01 | බඩුතොගය - 10 000<br>මුදල් + 12 500 | ලාභය + 2 500 | |
| | 02 | | | |
| | 03 | | | |
| | 04 | | | |
| | 05 | | | |

(ල.04)

(iv) නාලකගේ වෙළඳ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සිදු වූ ගැනුම් හා ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ගැනුම්කරු | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| 01/05 | 125 | පෙරේරා | - | 48 000 |
| 01/12 | 468 | - | උදාර | 21 000 |
| 01/15 | 469 | - | සුධාර | 28 000 |
| 01/20 | 1050 | සිල්වා | | 51 000 |

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත තොරතුරු ඇසුරින් නාලකගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ ගැනුම් ජ'නලය හා විකුණුම් ජ'නලය පිළියෙල කිරීම.

(ආ) ඉහත තොරතුරු ඇසුරින් ගැනුම් ගිණුම හා විකුණුම් ගිණුම පිළියෙල කිරීම. (ල.04)

(ලකුණු 12)

06. (i) ලාභ හෝ අලාභ ප්‍රකාශනය හා ආදායම් හා වියදම ගිණුම අතර දක්නට ඇති වෙනස්කම් 02 ක් දක්වන්න. (ල.02)

(ii) ව්‍යාපාරයක හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනු 02 ක් හා හිමිකම් අඩුවීමට බලපාන ගනුදෙනු 02 ක් සඳහන් කරන්න. (ල.02)

(iii) ජයතුංගගේ ව්‍යාපාරයේ 2019 දෙසැම්බර් මස සඳහා පිළියෙල කල ශේෂ පිරික්සුමෙහි හර තීරුවේ එකතුව බැර තීරුවට වඩා රු. 4 500 කින් අඩු විය. එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලද අතර වෙනසට පහත හේතු සොයා ගන්නා ලදී.

රු. 1 200 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වලින් මගහැරී ඇත.

ප්‍රචාරණ වියදම් ලෙස ගෙවූ රු. 5 000 එම ගිණුමේ සටහන් වී ඇත්තේ 500 ක් ලෙසය.

මෝටර් රථ අලුත්වැඩියා වියදම වූ රු. 4 800 මෝටර් රථ ගිණුමට පිටපත් කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම (ල.04)

(iv) සඳුනිගේ ව්‍යාපාරයේ 2020 අගෝස්තු මාසයේ පිළියෙල කල බැංකු ගිණුමේ ශේෂය රු. 42 000 ක් වූ අතර බැංකු විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් අගයක් ගන්නා ලදී. පහත හේතු ඒ සඳහා බලපා ඇත.

බැංකුවේ තැන්පත් කල රු. 40 000 චෙක්පත් උපලබ්ධි වී නොමැත.

නිකුත් කරන ලද රු. 30 000 ක චෙක්පත් බැංකුවට ඉදිරිපත් වී නොමැත.

ණය ගැතියන් විසින් රු. 4 000 ඍජුව බැංකුවේ තැන්පත් කර තිබුණි.

බැංකුව රු. 1 000 බැංකු ගාස්තු අයකර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) සංශෝධිත බැංකු ගිණුම

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය (ල.04)

(ලකුණු 12)

07. (i) (අ) ව්‍යාපාරයක දළ ලාභය ගණනය කිරීම සඳහා පිළියෙල කරන ගිණුම කුමක්ද?

(ආ) බොල්ණය ගිණුම්ගත කිරීමේ ද්විත්ව සටහන ලියන්න. (ල.02)

(ii) රන්තරු ක්‍රීඩා සමාජයේ 2019 වර්ෂයේ සිට සාමාජික සංඛ්‍යාව 50 කි. එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 200 කි. 2019 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| 1/1 | ශේෂය | 9 000 | ක්‍රීඩා උපකරණ ගැනුම් | 7 500 |
| | සාමාජික මුදල් | 8 000 | විදුලි වියදම් | 2 000 |
| | | | ක්‍රීඩා තරඟ වියදම් | 4 000 |
| | | | 12/31 ප/ගෙ/ශේෂය | 3 500 |
| | | 17 000 | | 17 000 |

අවශ්‍ය වන්නේ,

2019/12/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න. (ල.02)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) අසේලගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| මෝටර් රථ (පිරිවැයට) | 400 000 | |
| මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් (2019/01/01ට) | | 120 000 |
| තොගය (2019/01/01 දිනට) | 25 000 | |
| ගැනුම් | 215 000 | |
| විකුණුම් | | 318 000 |
| ණයගැතියෝ | 60 000 | |
| ණයහිමියෝ | | 42 000 |
| වැටුප් | 35 000 | |
| විදුලිය | 12 000 | |
| බොල්ණය | 4 000 | |
| දුන් වට්ටම් | 2 000 | |
| 15% බැංකු ණය | | 200 000 |
| ණය පොළිය | 23 000 | |
| බැංකු ගාස්තු | 1 000 | |
| මුදල් ශේෂය | 43 000 | |
| බැංකු ශේෂය | 160 000 | |
| ප්‍රාග්ධනය | | 300 000 |
| | 980 000 | 980 000 |

අතිරේඛ තොරතුරු

2019/12/31 දිනට තොගය 32 000 කි.

මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% ක් ක්ෂය කළ යුතුය.

2019/12/31 දිනට උපචිත වැටුප් රු. 2 500 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

(ආ) 2019/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (ල.08)

(ලකුණු 12)

### පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(1) | 4 -(3) | 5 -(4) | 6 -(2) | 7 -(3) | 8 -(3) | 9 -(2) | 10 -(1) |
| 11-(4) | 12 -(3) | 13 -(4) | 14 -(2) | 15 -(1) | 16 -(2) | 17 -(3) | 18 -(2) | 19 -(3) | 20 -(3) |
| 21-(4) | 22 -(3) | 23 -(1) | 24 -(3) | 25 -(3) | 26 -(2) | 27 -(3) | 28 -(4) | 29 -(4) | 30 -(2) |
| 31-(2) | 32 -(2) | 33 -(2) | 34 -(1) | 35 -(1) | 36 -(3) | 37 -(3) | 38 -(1) | 39 -(3) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

### II පත්‍රය - I කොටස

01. (i) (අ) ඒක පුද්ගල ව්‍යාපාර / තනි පුද්ගල ව්‍යාපාර / කේවල ස්වාමි ව්‍යාපාර / පෞද්ගලික අංශයේ ව්‍යාපාර / ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර (ල.01)

(ආ) අවශ්‍යතාව - සෞඛ්‍ය | වුවමනාව - මුඛ ආවරණ (ල. ½x2=01)

(ii) (අ) ගෝලීය පරිසරය

දේශපාලන පරිසරය (ල. ½x2=01)

(ආ) අවස්ථා - COVID වසංගතය පැතිර යාම
- රජය මුඛ ආවරණ පැළඳීමේ නීතිරීති පැනවීම.

ශක්තීන් - අයිතිකරුගේ ඇඟළුම් ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද
- ප්‍රාග්ධනය සමත් වන විට පුහුණු සේවකයන් සිටීම. (ල. ½x2=01)

(iii) (අ) මාධ්‍ය - ත්‍රිරෝධ රථය

මාර්ගය - මහා මාර්ගය (ල. ½x2=01)

(ආ) අයිතිකරු / යසනාත් බංඩාර / සේවකයන් / අත් උදව්කරු / බැංකුව / නගරයේ වෙළෙඳ සැල් (ල. ½x2=01)

(iv) (අ) සැලසුම්කරණයට - ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට තීරණය කිරීම.
ආරක්ෂිත ඇඳුම් කට්ටල මැසීමට තීරණය කිරීම.

සංවිධානකරණයට - සේවකයන් 02 බඳවා ගැනීමට අත් උදව්කරුවෙක් බඳවා ගැනීම. (ල. ½x2=01)

(ආ) A මිල

B ස්ථානය / බෙදා හැරීම (ල. ½x2=01)

(v)

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් | |
|---|---|---|---|---|---|
| +500 000 | | +500 000 | | - | (ල. ½) |
| +240 000 | | +240 000 | | - | (ල. ½) |
| +200 000 | | - | | +200 000 | (ල. ½) |
| +940 000 | = | 740 000 | + | 200 000 | |

හෝ

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 940 000 | = | 740 000 | + | 200 000 |

(vi) (අ) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජ'නලය (ල. ½x2=01)

(ආ) රු. 60 000

හෝ

| | |
|---|---|
| අත්පිට රෙදි මිලදී ගැනුම් | රු. 50 000 |
| ණයට රෙදි මිලදී ගැනුම් | රු. 10 000 |
| | රු. 60 000 |

(ල.01)

(vii) (අ) $240\,000 \times \frac{10}{100} \times \frac{1}{12}$ (ල. ½)

රු. 2 000 (ල. 01)

(ආ) මහන මැෂින් ක්ෂය ගිණුම හර 2 000
මහන මැෂින් ක්ෂය සටහන් කිරීමේ ගිණුම බැර 2 000 (ල.01)

(viii)

මුදල් පොත

| | | | | | |
|---|---|---|---|---|---|
| බැංකු ණය | ½ | 200 000 | රෙදි මිලදී ගැනුම් | 50 000 | |
| | | | අනෙකුත් ද්‍රව්‍ය | 6 000 | ½ |
| | | | ඇසුරුම් ද්‍රව්‍ය | 4 000 | |
| | | | මාසික විදුලි බිල | 3 000 | |
| | | | මැෂින් ක්‍රියාකරවන්නන්ගේ වැටුප් | 60 000 | ½ |
| | | | අත් උදව්කරුගේ වැටුප | 20 000 | |
| | | | ශේෂය ප/ගෙ | 57 000 | ½ |
| | | 200 000 | | 200 000 | |
| ශේෂය ඉ/ගෙ | | 57 000 | | | |

(ල.02)

(ix) (අ)

| | | |
|---|---|---|
| රෙදි මිලදී ගැනුම් | - අත්පිට | 50 000 |
| | ණයට | 10 000 |
| මහන මැෂින් ක්‍රියාකරවන්නන්ගේ වැටුප | | 60 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | | 4 000 |
| අනෙකුත් ද්‍රව්‍ය | | 6 000 |
| මාසික විදුලි බිල | | 3 000 |
| අත් උදව්කරුගේ වැටුප | | 20 000 |
| මහන මැෂින් ක්ෂය | | 2 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | | 155 000 |

ආකෘතියත් / පිළිවෙලත් අවශ්‍ය නැත. (ල.01)

(ආ) ඒකක පිරිවැය = $\frac{155\,000}{1\,000} = 155$

½ රු. $155 + \left(155 \times \frac{20}{100}\right)$
$155 + 31$
= රු. 186 (ල.01)

(x) (අ) $155\,000 \times \frac{20}{100}$ $155 \times \frac{20}{100}$

රු. 31 000

රු. 31
රු. $31 \times 1\,000$

රු. 31 000 (ල.01)

(ආ) ආරම්භක හිමිකම + ශුද්ධ ලාභය = අවසාන හිමිකම

740 000 + 31 000 = 771 000 (ල.01)

## I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ (ල.01)

(ආ) අත්‍යවශ්‍ය වීම, පොදු වීම, නිර්මාණය කළ නොහැකි වීම, සීමිත වීම, සරල වීම (ල.01)

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඇ) සත්‍ය (ඈ) අසත්‍ය (ල.02)

(iii) (අ) භූමිය - හිරුඑළිය, වාතාශ්‍රය, ජලය, මිදිවගා බිම්, කර්මාන්ත ශාලාව පිහිටි බිම

ශ්‍රමය - මිදි වගා කරුවන්ගේ ශ්‍රමය, වෙළෙඳ සේවක ශ්‍රමය

ප්‍රාග්ධනය - යන්ත්‍ර, මුදල්, කර්මාන්තශාලාව, අමුද්‍රව්‍ය තොග (මිදි)

ව්‍යවසාය - අයිතිකරුගේ ව්‍යාපාරික දැනුම (ල.01)

(ආ) මිදිවගාකරුවන්, වෙළෙඳ සේවකයන්, පාරිභෝගිකයින්, අයිතිකරු, රජය, ප්‍රජාව (ල.01)

(iv) (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් (ල.01)

(ආ) තරඟකරුවන් බහුල වීම. (ල.01)

03. (i) (අ) අරමුණු අනුව, හිමිකාරිත්වය අනුව, පරිමානය අනුව (ල.01)

(ආ) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම.

ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය

සාමාජිකයින්ගේ සාමූහික අයිතිය

පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්ත වීම. (ල.01)

(ii) (අ) අසත්‍ය (ආ) අසත්‍ය (ඇ) සත්‍ය (ඈ) අසත්‍ය (ල.02)

(iii) (අ) අණකරු - සිරිදාස

අණලදු - මාතර මහජන බැංකු ශාඛාව

ආදායක - පියදාස (ල.01)

(ආ)




හෝ ලංකා බැංකුව - මහරගම

ආදායකයාගේ ගිණුමට පමණි. (ල.02)

(iv) (අ) ගමනාන්තය දක්වා යොදාගත හැකි වීම.

ඕනෑම වේලාවක යොදාගත හැකි වීම.

තමාගේම ප්‍රවාහන සේවයක් පවත්වා ගත හැකි වීම. (ල.01)

(ආ) පණිවුඩය - ජල බෝතල් තොගයක් එවන්න.

මාධ්‍යය - විද්‍යුත් / ලිඛිත

ප්‍රතිචාරය - ජල බෝතල් තොගය එවීමට රුකාන්ත කටයුතු කිරීම.

ප්‍රතිපෝෂණය - ලොරි රථයකින් ජල බෝතල් තොගය එවන බව කාන්තිට කෙටි පණිවුඩයකින් දැනුම් දීම. (ල.01)

04. (i) (අ) ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම හා අරමුණු ඉටුකරගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලියයි. (ල.01)

(ආ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන්ම ලාබදායීව තෘප්තිමත් කල හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළඳපොල කොටස හෙවත් පාරිභෝගික කොටසයි. (ල.01)

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඇ) සත්‍ය (ඈ) අසත්‍ය (ල.02)

(iii) (අ) සංවිධානකරණය

(ආ) පාලනය

(ඇ) සැලසුම්කරණය

(ඈ) මෙහෙයවීම (ල.02)

(iv) (අ) පුද්ගලයකු තමා උපයන ආදායමෙන් ඉතිරිකරගත් මුදල ප්‍රමාණයක් යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගයක යෙදවීම. (ල.01)

(ආ) කොටස් වෙළඳපොළ කටයුතු විධිමත්ව හා සාධාරණව පවත්වාගෙන යාම. (ල.01)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන බේරුම් කිරීමේ දී ආර්ථක සම්පත් පිටතට ගලා යන වර්තමාන බැඳීමකි. (ල.01)

(ආ) ණය ගැති ගිණුම, මුදල් ගිණුම, ලී බඩු ගිණුම (ල.01)

(ii) (අ) රු. 50 000 ක බැංකු ණයක් ගැනීම.

(ආ) රු. 10 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම. (ල.02)

(iii) (අ)

| ගනුදෙනුව | වත්කම් = | හිමිකම් + | වගකීම් | |
|---|---|---|---|---|
| 02 | මුදල් +20 000 | පොළී වියදම -4 000 | බැංකු ණය +16 000 | (ල.1) |
| 03 | මුදල් - 28 000 | ලද වට්ටම +2 000 | ණය හිමි -30 000 | (ල.1) |
| 04 | මුදල් - 4 000 | විදුලි වියදම - 4 000 | | (ල.½) |
| 05 | මුදල් - 50 000<br>ලී බඩු + 50 000 | | | (ල.½) |

(ආ) මුදල් ශේෂය - රු. 73 000 කි. (ල.01)

(iv) ගැනුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි. |
|---|---|---|---|---|
| 01/05 | 125 | පෙරේරා | 48 000 | |
| 01/20 | 1050 | සිල්වා (ල.½) | 51 000 | |
| 01/30 | එකතුව ගැනුම් ගිණුමට හර කළා | | 99 000 (ල.½) | |

ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 1/31 | ණයහිමි ගිණුම | | 99 000 | | | | | (½) |

විකුණුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | වටිනාකම | ස.පි. |
|---|---|---|---|---|
| 01/12 | 468 | උදාර | 21 000 | |
| 01/15 | 469 | සුධාර (ල.½) | 28 000 | |
| 01/31 | එකතුව විකුණුම් ගිණුමට බැර කළා | | 49 000 (ල.½) | |

විකුණුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | 1/31 | ණයගැති ගිණුම | | 49 000 (½) |

නිවැරදි ප්‍රකාශයට (ල.01)

06. (i)

| ලාභ හෝ අලාභ ප්‍රකාශනය | ආදායම් වියදම් ගිණුම |
|---|---|
| ලාභ අරමුණු කරගත් ව්‍යාපාර විසින් පිළියෙල කරයි. | ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර විසින් පිළියෙල කරයි. |
| ලාභය හෝ අලාභය ගණනය කරයි. | අතිරික්තය හෝ ඌණතාවය ගණනය කරයි. (ල.02) |

(ii) <u>වැඩිවීමට</u>

ආදායම් ලැබීම

අතිරේඛ ප්‍රාග්ධනය යෙදවීම (ල.01)

<u>අඩුවීමට</u>

වියදම් දැරීම

ගැනිලි සිදු කිරීම (ල.01)

(iii) අවිනිශ්චිත ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 4 500 | ප්‍රචාරණය | 4 500 (½) |
| | 4 500 | | 4 500 |

පොදු ජ'නලය

| දිනය | ජ'නල් ව/අ | විස්තරය | ලෙ. පි. | හර | බැර | |
|---|---|---|---|---|---|---|
| | | ණයගැති ගිණුම හර | | 12 000 | | |
| | | විකුණුම් ගිණුම | | | 12 000 | (ල.01) |
| | | ප්‍රචාරණ වියදම් ගිණුම හර | | 4 500 | | |
| | | අවිනිශ්චිත ගිණුම | | | 4 500 | (ල.01) |
| | | මෝටර් රථ අලුත්වැඩියා වියදම් ගිණුම හර | | 4 800 | | |
| | | මෝටර් රථ ගිණුම | | | 4 800 | (ල.01) |

(ල.04)

(iv)

සංශෝධිත බැංකු ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | (½) | 42 000 | බැංකු ගාස්තු | 1 000 | (½) |
| ප්‍රේෂණ | (½) | 4 000 | ප/ගෙ/ශේෂය | 45 000 | |
| | | 46 000 | | 46 000 | |

(ල. 1½)

බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 45 000 | |
| (එකතු කලා) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත | 30 000 | 30 000 | (1) |
| | | 75 000 | |
| (අඩුකලා) උපලබ්දිත නොවූ චෙක් | 40 000 | (40 000) | (1) |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | 35 000 | (½) |

(ල. 4)

07. (i) (අ) වෙළඳ ගිණුම (ල.01)

(ආ) බොල්ණය ගිණුම් හර

ණයගැති ගිණුම බැර (ල.01)

(ii)

රන්තරු ක්‍රීඩා සමාජයේ
2019/12/31 අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය (½)

| | | | |
|---|---|---|---|
| <u>ආදායම්</u> | | | |
| සාමාජික මුදල් | 10 000 | 10 000 | (½) |
| <u>වියදම්</u> | | | |
| විදුලි වියදම් | 2 000 | | |
| ක්‍රීඩා තරඟ වියදම් | 4 000 | 6 000 | (½) |
| අතිරික්තය | | 4 000 | (½) |

(ල.02)

(iv)

අසේලගේ ව්‍යාපාරයේ
2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (½)

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් | | | 318 000 | |
| (-) විකුණුම් පිරිවැය | | | | |
| 2019/01/01 තොගය | | 25 000 | | |
| ගැනුම් | | 215 000 | | |
| විකිණීමට ඇති තොග පිරිවැය | | 240 000 | | |
| අඩුකලා | | | | |
| 2019/12/31 තොගය | (½) | (32 000) | (208 000) | (½) |
| විකුණුම් පිරිවැය | | | 110 000 | (½) |
| දළ ලාභය | | | - | |
| | | | 110 000 | |
| වෙනත් ආදායම් | | | | |
| - | | - | | |
| බෙදාහැරීමේ වියදම් | | | | |
| මෝටර් රථ ක්ෂය (½) | 40 000 | | | |
| බොල් ණය | 4 000 | | | |
| දුන් වට්ටම | 2 000 | 46 000 | | |
| පරිපාලන වියදම් | | | | |
| වැටුප් (½) | 37 500 | | | |
| විදුලිය | 12 000 | 49 500 | | |
| මූල්‍ය වියදම් | | | | |
| බැංකු ණය පොලී (½) | 30 000 | | | |
| බැංකු ගාස්තු | 1 000 | 31 000 | (126 500) | |
| ශුද්ධ අලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කලා | | | (16 500) | (½) |

අසේලගේ ව්‍යාපාරයේ
2019/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (½)

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ අගය | (½) |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | | |
| මෝටර් රථ | 400 000 | 160 000 | 240 000 | (½) |
| | 400 000 | 160 000 | 240 000 | (½) |
| ජංගම වත්කම් | | | | |
| 2019.12.31 තොගය | | 32 000 | (½) | |
| ණය ගැතියෝ | | 60 000 | | |
| මුදල් ශේෂය | | 43 000 | | |
| බැංකු ශේෂය | | 160 000 | 295 000 | |
| මුළු වත්කම් | | | 535 000 | |
| ප්‍රාග්ධනය | | 300 000 | | |
| (+) ශුද්ධ ලාභය | (½) | (16 500) | 283 500 | |
| ජංගම නොවන වගකීම් | | | | |
| බැංකු ණය | | 200 000 | 200 000 | |
| ජංගම වගකීම් | | | | |
| ණය හිමියෝ | | 42 000 | | |
| උපචිත වැටුප | | 2 500 | (½) | |
| උපචිත ණය පොළී | | 7 000 | (½) 51 500 | |
| | | | 535 000 | |

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

